**වීරකැටිය ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු. 603,152 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව වියදම් හඳුනා ගෙන ගිණුම්ගත කරමි. | වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.9,382,490 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඇස්තමේන්තුගත වටිනාකම පමණක් වර්ෂයට අදාළ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම්ගත කළෙමි. | ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු. 8,737,611 ක් වුවත්, එය රු.8,494,923 ක් ලෙස රු.242,688 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරමි. | වගකීම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂය වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය වාරික එකතු වටිනාකම වූ රු. 2,647,511 ක් ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරමි. | වගකීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2018 වර්ෂයේදී කඩ කාමර 04 ක් බදු දීමෙන් ලැබිය යුතු රු. 1,340,000 ක එක්වන් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරමි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2019 හා 2020 වර්ෂයේදී සභාව සිදුකරන ලද වියදම් ප්‍රතිපූර්ණය සඳහා ආයතන 04 කින් ලබාදුන් රු.1,035,000 ක් වියදම් ප්‍රතිපූර්ණ ලෙස සටහන් නොකර තැන්පත් ලෙස දක්වා තිබුණි. | වියදම් ප්‍රතිපූර්ණ ලෙස ලද සියළුම මුදල් ආදායමට ගෙන සංවර්ධන කටයුතු සඳහා යොදවමි. | වියදම් ප්‍රතිපූර්ණය වීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු ඉඩම් 04 ක් සංවර්ධනය කිරීම සඳහා දැරූ එකතුව රු.529,579 ක් ප්‍රාග්ධන වියදම් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වියදම් ආදාළ වත්කම් ගිණුම් යටතේ ප්‍රාග්ධනිත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.499,512,489 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළව ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 2,987,332 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 534,039,014 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේශන සකස් කිරීමට කටයුතු කරමි | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,240,704 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 27,595,351 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | ලැබිය යුතු වරිපනම් බදු රු. 5,030,480 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කිරීමට උපදෙස් සහ මාසිකව ප්‍රගතිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ලබා දීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| ii. | ලැබිය යුතු රු. 313,050 ක ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කරමි. | -එම- |
| iii. | ලැබිය යුතු රු. 29,832 ක අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර ලේඛන නිවැරදි කර ගැනීමටත්, හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කරමි. | -එම- |
| **(ආ)** | **කුලී** | | |
| i. | ලැබිය යුතු කඩ කුලී රු. 128,264 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| ii. | සභාව සතු පොළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු.5,138,146 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | ලැබිය යුතු රු. 25,550 ක බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| **(ඈ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 672,778 ක් හා රු. 28,262,648 ක් විය. | හිඟය අයකර ගැනීමට කටයුතු කරමි.. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරී සංශෝධිත පනත හා අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඊට සිදුකර තිබූ සංශෝධන ප්‍රකාර අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රායෝජනයට ගැනීම මත එක් දිනකට රු. 50 ක් වූ රු.614,940 ක දඩ මුදලක් ගොඩනැගිලි සංවර්ධන සැලසුම් 10 කින් අයකර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී අදාළ පනත හා ඒ හා සම්බන්ධ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කරමි. | පනත සහ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර ස්ථාන 05 ක පරිසර ආරක්ෂණ බලපත්‍රයේ වලංගු කාලය පරීක්ෂා කිරීමකින් තොරව වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණු අතර අදාළ කර්මාන්තයන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමටඋනන්දු කරවීමට සභාව කටයුතු කර නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර නොගත් ව්‍යාපාර එම බලපත්‍ර ලබා ගැනීමට යොමු කරවමි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු පර්චස් 546.8 ක් වූ ඉඩම් 07 ක් ඵලදායි කාර්යයක යෙදවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට නිශ්කාර්යව පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාවට අනුව නිශ්චිතව හඳුනා නොගත් පර්චස් 1370 ක් වූ ඉඩම් 10 ක් පැවතුණි. | දේපල හඳුනා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර වගා කළ හැකි ඉඩම් වගා කිරීමට ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමි. | සභාව සතු ඉඩම් ඵලදායි කාර්යයකට යෙදවිය යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) ප්‍රකාරව සීමිත මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට පමණක් අවස්ථාව ලබාදිය යුතු වුවත්, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් මිල ගණන් කැඳවා එකතු වටිනාකම රු.506,000 ක් වූ ටයර් 12 ක් මිලදී ගෙන තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය සහ ලියාපදිංචි සැපයුම්කරුවන් දිස්ත්‍රික්කයෙන් පිටත සිටීම නිසා විවෘතව තිබූ ආයතනයෙන් මිලදී ගත්තෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |